**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

**දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය**

# තනතුරු පුරප්පාඩු

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ පහත තනතුරු සඳහා ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| නීති නිලධාරී (MM 1) - තනතුර 01 (වසරක කොන්ත්‍රාත් පදනම) | |
|---|---|
| අධ්‍යාපන හා වෘත්තීමය සුදුසුකම් | ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු ලෙස දිවුරුම් දී තිබිය යුතුය.<br>**සහ**<br>තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර තුනක (03) සුදුසුකම් ලැබීමේ පළපුරුද්ද |
| වයස් සීමාව | අවුරුදු 22ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. |
| වැටුප් පරිමාණය | රු. 99,510.00 (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 01/2025) |
| රැකියාවේ ස්වභාවය | කොන්ත්‍රාත් හා අර්ථසාධක සහිත |
| **මනෝ උපදේශක - තනතුර 01 (වසරක කොන්ත්‍රාත් පදනම)** | |
| අධ්‍යාපන හා වෘත්තීමය සුදුසුකම් | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් මනෝවිද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම.<br>**හෝ**<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් මූලික උපාධියක් ලබා තිබීම සමග මනෝ උපදේශනය පිළිබද ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම.<br>**හෝ**<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් මනෝවිද්‍යාවට හා මනෝ උපදේශනය පිළිබඳ විෂයන් ඇතුලත් උපාධියක් ලබා තිබීම.<br>**සහ**<br>පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු, තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්ද |
| වයස් සීමාව | අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. |
| වැටුප් පරිමාණය | රු. 67,631.00 (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 01/2025) |
| රැකියාවේ ස්වභාවය | කොන්ත්‍රාත් හා අර්ථසාධක සහිත |

මෙම තනතුරු සඳහා බඳවා ගැනීම / නොගැනීම සම්බන්ධව සියලුම බලතල දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය සතුය.

රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් තෝරා ගනු ලැබුවහොත්, නිදහස් කිරීමේ හැකියාව දක්වමින් අදාළ ආයතන ප්‍රධානියා හරහා තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත නිල වෙබ් අඩවිය වන https://nata.gov.lk/index.php/en/vacancies මගින් ලබාගත හැක.

අයදුම්කරුවන් විසින් මාර්ගගත අයදුම් පත්‍රය සම්පූර්ණ කර, ඊට පහළින් සපයා ඇති සබැඳියෙන් නව අයදුම්පත බාගත කර, නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත සමඟ සුදුසුකම් සහ පළපුරුදු සඳහා අදාළ සහතිකවල පිටපත්, ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට 2026 සැප්තැම්බර් 30 වන දින හෝ ඊට පෙර එවිය යුතු අතර, ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරන ලද තනතුර සඳහන් කළ යුතුයි.

**සභාපති,**
**දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය,**
**11 වන මහල "ඒ", සෙත්සිරිපාය දෙවන අදියර,**
**බත්තරමුල්ල.**

**දු. අං. - 0112187140 ෆැක්ස් - 0112186024**